# 12 ශ්‍රේණිය

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

# 02 – පාඩම


# සන්නිවේදනයේ පදනම






## 2.1 සන්නිවේදනය යන්න හඳුන්වා දෙයි.

- තොරතුරු හුවමාරුව සන්නිවේදනය යි.
- මානව සන්නිවේදනය මානව සමාජ සම්භවය තරම් ම පැරණි  ය.
- මානවයෙකු ලෙස අප සිදුකරන සිතීම, ස්පර්ශය, ආඝ්‍රාණය, දැකීම, කතා කිරීම, විදීම, කියවීම, ලිවීම, විනෝදවීම ආදී සෑම කාර්යයක් ම සන්නිවේදනය හා සෘජුව හෝ වක්‍ර ව සම්බන්ධතාවයක් දක්වයි.



- පුද්ගල හා සමාජ සම්බන්ධතාවන්ගේ පදනම සන්නිවේදනය යි.



- සන්නිවේදනය යන පදයේ පෘථුල අර්ථය **''දැන ගත් දේ දැන ගැනීමට සැලැස්වීම''** යන්න යි.
- ඉංග්‍රීසි **''Communication ''** යන පදය ලතින් භාෂාවේ **''පොදු බවට පත්කිරීම''** යන අරුත සහිත '' **Communis** '' යන වාංමූලයෙන් බිඳී ආවකි.
- සිංහලයේ සන්නිවේදනය යන වචනයෙහි අර්ථය '' **මැනවින් දැනුම් දීම''** යන්න යි.

- දෙමළ භාෂාවෙන් සන්නිවේදනය යන්න '' **තොඩර්පාඩල්** '' යනුවෙන් හඳුන්වයි. එහි අර්ථය වනුයේ '' **සබඳතා පැවැත්වීමේ**'' ක්‍රියාවලිය යන්න යි.

- සාමාන්‍ය සන්නිවේදන අවස්ථාවන්හි දී තොරතුරු ගැනීම සහ දීම (හුවමාරුව) සඳහා පංචේන්ද්‍රියන් යොදා ගැනේ.

- මිනිසා නිර්මාණය කරගත් භාෂාව හේතුවෙන් වඩාත් සංකීර්ණ අදහස්, සංකල්ප, හුවමාරු කරගත හැකි විය.

- ලේඛනය ආරම්භයත් සමඟ තොරතුරු ගබඩා කර කල්තබා ගැනීමට පදනම සැකසුණි.

- සන්නිවේදන තාක්ෂණයේ දියුණුවත් සමඟම තොරතුරු හුවමාරුව කඩිනම් විය.


- ජනමාධ්‍ය ආගමනයත් සමඟම තොරතුරු රාශියක් විශාල පිරිසක් වෙත, එකවර, කඩිනමින් බෙදා හැරීමේ හැකියාව ලැබිණ.




- සන්නිවේදනයේ ස්වභාවය පිළිබඳ හඳුනා ගැනීමට එහි පොදු ගති ලක්ෂණ කවරේදැයි විමසා බැලිය යුතුය.



## 2.2 සන්නිවේදනයෙහි ස්වභාවය අවබෝධයෙන් යුතුව පැහැදිලි කරයි.




**"සන්නිවේදනය අරමුණු සහගත ය ".**

ඕනෑ ම අවස්ථාවක දී අප සන්නිවේදනයේ යෙදෙන්නේ කිසියම් අරමුණක් ඇතිව යි.



- තොරතුරු ලබාදීම.
- තොරතුරු ලබාගැනීම.
- කුතුහලය සමනය කරගැනීම.
- වින්දනයක් ලබා ගැනීම.





තොරතුරු ලබා දෙන හා ලබා ගන්නා පාර්ශව අතර මෙම අරමුණු පිළිබඳව පැහැදිලි අවබෝධයක් ඇත්නම් සන්නිවේදනය සාර්ථක වේ.

**<u>''සන්නිවේදනය සංකේතාත්මක ය''.</u>**

සන්නිවේදනය යනු සංකේතමය ක්‍රියාකාරිත්වයකි. තොරතුරක් නැතහොත් සන්දේශයක් යනු සංකේතවලින් සමන්විත වූවකි. මේ අනුව **වචන, සංඥා, ලකුණු, මුද්‍රා, ඉඟි, සිතියම්, සිතුවම්, අකුරු** පමණක් නොව ශබ්ද පවා සැලකිය යුතු වන්නේ සංකේත ලෙස ය.



විවිධ වූ වස්තු, පුද්ගලයන්, ස්ථාන මෙන්ම අතිශය සංකීර්ණ හැඟීම්, අදහස්, සංකල්ප, ආදිය පිළිබඳ තොරතුරු හුවමාරු කරගැනීමට හැකියාව ලැබී ඇත්තේ සංකේත මත පදනම්ව සිදු කරන මෙම ගනුදෙනුව නිසා ය.



## සන්නිවේදනය සන්දර්භානුගත ය''.

කවර හෝ සන්නිවේදනයක් සිදුවන්නේ කිසියම් සන්දර්භයක් තුළ යි. මෙයින් අදහස් වන්නේ අදාළ සන්නිවේදනය සිදුවන ''වටපිටාව'' නැතහොත් ''පරිසරය'' යි.









සන්නිවේදන කාර්යය හා සන්දර්භය අතර සෘජු සබඳතාවක් පවතී. සන්දර්භයට ගැළපෙන ලෙස සන්නිවේදන කාර්යය සකස් විය යුතුය. මෙහි සන්දර්භය යන්න හුදු භෞතික වටපිටාවට පමණක් ලඝු කළ යුතු නො වේ. මන්ද විටෙක පුද්ගලයන් , ස්ථාන, වෘත්තීය, සංස්කෘතිය වැනි දේ පවා සන්දර්භය යන්නට අඩංගු විය හැකි ය.

## ''සන්නිවේදනය ක්‍රියාපටිපාටිය කි''.

සන්නිවේදනය කිසිවිටෙකත් හුදෙකලාව පවතින වෙනස් නොවන දෙයක් නො වේ.

එය නිරන්තරයෙන් කාලයත් සමඟ වෙනස් වෙයි. ඕනෑම සන්නිවේදන අවස්ථාවක කිසියම් ක්‍රියාවලියක් සිදුවේ.

නිදසුනක් ලෙස ලිඛිත සන්නිවේදන අවස්ථාවකදී පියවර ගණනාවක් පසු කරයි.



එම ක්‍රියාවලිය හා සිතීම → සැලසුම් කිරීම → ලිවීම → සංස්කරණය කිරීම → නැවත ලිවීම යන විවිධ අවස්ථා ගණනාවක් පසු කර ***අවසන් ප්‍රතිඵලය වෙත එළඹේ.***

මෙසේ ඕනෑ ම සන්නිවේදන අවස්ථාවක දී ඊට අනුරූප වූ ක්‍රියාවලියක් සිදුවේ.

## **''සන්නිවේදනය විවිධාකාර ය''.**

සන්නිවේදන වර්ග හා ස්වරූප පිළිබඳ ව අවධානය යොමු කිරීමෙන් ම එහි විවිධාකාර බව පිළිබඳ මූලික අවබෝධයක් ලැබිය හැකි ය.

එක් එක් සන්නිවේදන වර්ග හා ස්වරූප විවිධ සන්දර්භයන්හි දී විවිධ වෙනස්කම් වලට හා පරිවර්තනයන්ට භාජනය වේ.

- ✍ පුද්ගලාන්තර සන්නිවේදනයට වඩා කණ්ඩායම් සන්නිවේදනය වෙනස් වෙයි.



- ✍ කථන සන්නිවේදනයට වඩා ලිඛිත සන්නිවේදන ස්වරූප වෙනස් වෙයි.



- ✍ කථන සන්නිවේදන ස්වරූපය ආගමික සන්දර්භයක දී එක ආකාරයකටත් දේශපාලන සන්දර්භයක දී ඊට වඩා වෙනස් ආකාරයකටත් සිදුවේ.



- ✍ අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය හැරුණු කොට අන් සියලු සන්නිවේදන වර්ග තාක්ෂණය නිසා කලින් කලට විවිධ පරිවර්තනයන්ට ලක්වීම වැළැක්විය නොහැකි ය.

- ✍ සංස්කෘතිය ද සන්නිවේදනයේ විවිධත්වයට හේතුවන වැදගත් සාධකයකි.

- ✍ රට රටවල විවිධ සමාජයන්හි පවතින විවිධාකාර සංස්කෘති හා උපසංස්කෘතීන්හි දක්නට ලැබෙන සන්නිවේදනය ආශ්‍රිත ක්‍රියාකාරකම්වල විවිධතා මීට නිදසුන් වේ.

- ✍ සංස්කෘතිය ද කලින් කලට වෙනස් වන නිසා ඊට අනුරූපව සන්නිවේදනයේ ද වෙනස්කම් ඇති විය හැකිය.

## '' සන්නිවේදනය ඒක මාර්ගික මෙන්ම ද්වි - මාර්ගික වූව කි.''



- ❖ සන්නිවේදනය ගනුදෙනුවකි.
  එනම් තොරතුරු ලබා ගැනීම හා ලබා දීම යන කාර්යයන් දෙකම සිදුවේ.

- ❖ මේ ගනුදෙනුවට සම්බන්ධ වන පාර්ශව දෙකම ඊට සක්‍රියව දායක වීමෙන් ඉහළ ප්‍රතිඵල ලැබේ.

- ❖ සන්නිවේදන අවස්ථා බහුතරයක් ද්වි - මාර්ගික තත්ත්වයක් පෙන්නුම් කරයි.

- ❖ ඉද හිට ඒක මාර්ගික සන්නිවේදනයන් සිදුවන අවස්ථා ද පවතී.



## '' සන්නිවේදනය බලය වේ.''

- ✍ දැනුම මත ගොඩනැගෙන බලයේ පදනම සන්නිවේදනය යි.

- ✍ බලය හා නායකත්වය අතර ඇත්තේ අවියෝජනීය සබඳතාවයකි.



- ✍ නායකයාට සිය කණ්ඩායම් සහයෝගය අහිමි වූ විට නායකත්වය ද අහිමි වෙයි.

- ✍ එබැවින් නායකයා හොද සන්නිවේදනයකු විය යුතු ය.

- ✍ ආගමික, අධ්‍යාපනික, දේශපාලනික, වානිජ ආදී කවර ක්ෂේත්‍රයක වුව ද මෙම තත්ත්වය දැකිය හැකි ය.

- ✍ සියලු ආකාරයේ සන්නිවේදන වර්ග ''බලය'' උත්පාදනයට අවශ්‍ය පසුබිම සැකසීමට උදවු වේ''.

**අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය ➡ තර්කානුකූල චින්තනයේ වර්ධනයටත්**


**පුද්ගලාන්තර හා කණ්ඩායම් සන්නිවේදනය ➡ පුද්ගල මහජන සම්බන්ධතා දියුණු කිරීමටත්**

**ජන සන්නිවේදනය ➡ ප්‍රසිද්ධිය, ජනප්‍රියත්වය හා ප්‍රතිරූප ගොඩනැගීමටත් සෘජු ව හා වක්‍ර ව දායක වෙයි.**

මේ සියල්ල අඩු - වැඩි වශයෙන් බලය නිර්මාණය වීමට අවශ්‍ය පදනම ගොඩ නගයි.

## 2.3 සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග විග්‍රහ කරයි.

සන්නිවේදන ක්‍රියාවලිය තේරුම් ගැනීමට හා එය සාර්ථකව ක්‍රියාත්මක කිරීමටත් එකී ක්‍රියාවලියේ අන්තර්ගත මූලිකාංග පිළිබඳ අවබෝධයක් ලැබිය යුතු ය.




- සන්නිවේදකයා



තමන් සමඟ සහ තවත් පාර්ශවයක් සමඟ තොරතුරු, අදහස්, මත, ආකල්ප ආදිය හුවමාරු කර ගන්නා තැනැත්තා සන්නිවේදකයායි.

පුද්ගලයෙකු පමණක් නොව අවස්ථානුකූලව කණ්ඩායමක්, සංවිධානයක්, ආයතනයක් වුව ද සන්නිවේදක ස්ථානය නියෝජනය කළ හැකි ය.
සන්නිවේදන ක්‍රියාවලිය යම් මට්ටකට පාලනය කිරීමේ හැකියාව සන්නිවේදකයා සතුවේ.

- ආකේතකරණය



ආකේතකරණය යනු අපගේ සිතේ ඇති වන අදහස්, හැඟීම් තවත් පාර්ශවයක් සමඟ සන්නිවේදනය කිරීම සඳහා කේත උපයෝගී කර ගනිමින් ඒවා සන්දේශ බවට පරිවර්ථනය කිරීමේ ක්‍රියාවලිය යි. සෑම සන්නිවේදන ක්‍රියාවලියක ම මෙය සිදුවේ.

- **සංදේශය**



සන්නිවේදකයා අනෙක් පාර්ශවය සමඟ හුවමාරු කර ගන්නා තොරතුරු සන්දේශයයි. එය අදහසක්, මතයක්, ආකල්පයක් වැනි විවිධ ස්වරූප ගැනීමට ඉඩකඩ ඇත.

පණිවුඩයක් සෑම විටම සංකේත අසුරින් ගොඩ නැගේ. සංකේත යන්න වචන, ශබ්ද, වර්ණ, හැඩ, රූව ආදී ලෙස විවිධාකාර විය හැකි ය. සන්දේශ සමාජ, සංස්කෘතික සාධක මත විවිධ අර්ථ ගැන්වේ.

- **නාලිකාව / මාධ්‍යය**



සන්නිවේදන ස්ථානයේ සිට අපේක්ෂිත පාර්ශවය වෙත සංදේශ ගෙන යනු ලබන්නේ නාලිකාව මගිනි.

සාමාන්‍යයෙන් එදිනෙදා සන්නිවේදනයේ දී භාවිත කරනු ලබන නාලිකාව වන්නේ පන්චේඉන්ද්‍රිය යි.
ඇස (දැකීම) කන (ඇසීම) බහුල ලෙස යොදා ගැනෙන ඉන්ද්‍රියන් වේ.

තාක්ෂණයේ ආගමනයත් සමඟ මෙකී නාලිකාව හෙවත් මාධ්‍යයවල පරිවර්ථනයන් සිදුව ඇත.

- **ග්‍රාහකයා**




සන්නිවේදකයා විසින් සිය සන්දේශය හුවමාරු කර ගැනීමේ අපේක්ෂාව ඇතිව එය ඉදිරිපත් කරනු ලබන්නේ කවරකු වෙත ද ඒ ග්‍රාහකයා යි.
ග්‍රාහකයන් විශාල ප්‍රමාණයක් ''ග්‍රාහක ක්ෂේත්‍රය'' ලෙස හඳුන්වයි.
සන්නිවේදන ක්‍රියාවලියේ දී ග්‍රාහකයා ද සන්නිවේදකයා හා සමාන වැදගත් කමක් උසුලයි.

- **විකේතකරණය**



සන්දේශයන්හි අන්තර්ගතය අර්ථකථනය කර අවබෝධ කර ගැනීමේ ක්‍රියාවලිය **විකේතකරණය** ලෙස හැඳින්වේ. මෙය සියලු සන්නිවේදන ක්‍රියාවලියන්හි දැකිය හැකි වේ. අප වෙත

ලැබෙන සංදේශයක් සමන්විතව ඇත්තේ සංකේත වලිනි. එම සංකේතවලින් කියවෙන දේ අවබෝධ කර ගැනීම සඳහා සංකේත අර්ථකථනය කර ගත යුතුයි.

- **ප්‍රතිපෝෂණය**



සන්නිවේදකයා සන්දේශයක් ලබා දුන් පසු ග්‍රාහකයා ඒ සම්බන්ධයෙන් සන්නිවේදකයා වෙත ලබා දෙන නිරීක්ෂණය කල හැකි ආකාරයේ ප්‍රතිචාරය **ප්‍රතිපෝෂණය යි.**

සන්නිවේදන ක්‍රියාවලියේ සාර්ථකත්වය සම්බන්ධයෙන් ප්‍රතිපෝෂණය අතිශය වැදගත් වේ.
ප්‍රතිපෝෂණය, ධනාත්මක හෝ ඍණාත්මක විය හැකි අතර ප්‍රතිපෝෂණය ලැබීමට ගත වන කාලය අනුව එය ක්ෂණික හෝ ප්‍රමාද ප්‍රතිපෝෂණයක් ලෙස හදුනා ගත හැකිය.

- ඝෝෂා / බාධා



සන්නිවේදක ස්ථානයේ සිට ග්‍රාහක ස්ථානය දක්වා සන්දේශ සම්ප්‍රේෂණය වීමේදී ඊට අවහිර වන ලෙස මැදිහත් වන ඕනෑම තත්වයක් **ඝෝෂාවක් හෙවත් බාධාවක්** වේ.

ප්‍රධාන සන්නිවේදක බාධක වර්ග දෙකකි.

**මාධ්‍ය බාධක/ නාලිය බාධක**

නාලිකාවේ හෙවත් මාධ්‍යයේ ඇති වන දෝෂ සහගත තත්ත්වයන් නිසා ඇති වන බාධා මාධ්‍ය බාධක වේ.



- විදුලිය විසන්ධි වීම නිසා ඇති වන බාධක
- රූපරාමු අපැහැදිලි වීම නිසා ඇති වන බාධක

**අර්ථ බාධක**

සන්දේශයේ අර්ථය හරි හැටි ග්‍රහණය කර ගැනීමට නොහැකි වන විට උද්ගත වේ.

**නිදසුන්** -

- උප භාෂා භාවිතය නිසා ඇති වන බාධක
- සාවද්‍ය උච්චාරණය නිසා ඇති වන බාධක

- **අත්දැකීම් පසුතලය**



පුද්ගලයා සතු පූර්ව අත්දැකීම් සමූහය මෙයින් අදහස් කෙරේ.
සන්නිවේදක ග්‍රාහක පාර්ශ්ව අතර සමාන ආකාරයේ පූර්ව අත්දැකීම් වැඩි ප්‍රමාණයක් ඇති විට සන්නිවේදන කාර්යය පහසු වේ.

- **සන්දර්භය**

අදාළ සන්නිවේදන ක්‍රියාවලිය සිදුවන්නා වූ සම්බන්ධතා ඇතුළත් පරිසරය යි. සන්දර්භය පැහැදිලි ලෙස ම සන්නිවේදන ක්‍රියාවලිය මත බලපෑම් ඇති කරයි. හොඳ සන්නිවේදකයෙක් හැම විට ම සිය සන්නිවේදනය ඊට පාදක වන සන්දර්භයට උචිත ලෙස සකසා ගනියි. ඊට අනුගත නොවීම විවිධ සන්නිවේදන ගැටලු වලට හේතු වේ.




- **බලපෑම**

සෑම සන්නිවේදනයක ම කිසියම් බලපෑමක් අන්තර්ගත වේ. එහි බලපෑමේ ස්වභාවය විවිධාකාර විය හැකිය. වරෙක එය ආකල්පමය හෝ චර්යාමය හෝ වෙනසක් ඇති කිරීම ඉලක්ක කර සිදු කරන සන්නිවේදනයක් විය හැකි ය. ඇතැම් විට ලාභය වැනි මූල්‍ය ප්‍රතිලාභයන් අරමුණු කර ගත හැකි ය. සන්නිවේදන ක්‍රියාවලියේ සාර්ථකත්වය තීරණය වන්නේ අපේක්ෂිත බලපෑම සාක්ෂාත් කර ගන්නේ ද යන්න මත යි.


## 2.4 සන්නිවේදනය යනු කුමක්ද යන්න නිර්වචනය කරයි.


විවිධ විද්වතුන් හා ආයතනික සංවිධාන මගින් ඉදිරිපත් කර ඇති සන්නිවේදනය පිළිබඳ නිර්වචන කිහිපයක් විමසා බලමු.











"යම් කිසිවෙකු , යම් කිසිවක්, කිසියම් නාලිකාවකින් යම් කිසිවෙකුට කිසියම් බලපෑමක් කිරීම සඳහා ප්‍රකාශ කරනු ලබන දෙය සන්නිවේදනයයි."
හැරල්ඩ් ඩී. ලැස්වෙල් ( Harold D. Lasswell )
- 1948 -







"සන්නිවේදනය යනු යම් තැනකදී නිර්මාණය කර ගත් හෝ තෝරාගත් පණිවිඩයක් ඒ ආකාරයෙන් ම හෝ ඊට සමාන ලෙස වෙනත් තැනක දී ප්‍රතිනිර්මාණය කිරීම යි."
ශැනන් සහ වීවර් ( Shannon and Weaver ) - 1949 -






“මානව සම්බන්ධතා රඳවා සිටින්නා වූත්, වර්ධනය
කරන්නා වූත්, සියලු සංකේත මෙන් ම ඒවා
දේශයෙන් දේශයට ප්‍රවාහණය කිරීමටත්, කාලයේ
බැදුම්වලින් ඔබ්බට ගොස් සුරක්ෂිත කර ගැනීමටත්
උපකාරී වන උපක්‍රම සන්නිවේදනය යි.
**චාල්ස් එච්. කුලි** *(Charles Horton Cooley)*

Oxford
Oxford
Dictionary of
English
DICTIONARY
Powered by Oxford Corpus
The world's most trusted dictionaries
OXFORD

අදහස, දැනුම, යනාදිය භාෂණය හෝ ලේඛනය
හෝ සංඥා මඟින් ප්‍රදානය කිරීම, ප්‍රකාශ කිරීම,
හෝ හුවමාරු කර ගැනීම සන්නිවේදනය යි.
**ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂය**
*(The Oxford Dictionary)*
*-1990 -*

## 2.5 සන්නිවේදනයේ මූලික කාර්යයන් පිළිබඳ අවබෝධයෙන් යුතු ව පැහැදිලි කරයි.

සන්නිවේදනයේ මූලික කාර්යයන් 04 ක් හඳුනා ගත හැකි ය.

- **තොරතුරු සම්පාදනය**



සෑම සන්දේශයක් ම තොරතුරක් ලෙස සැලකිය හැකි අතර සෑම සන්නිවේදන අවස්ථාවකදීම අඩු වැඩි වශයෙන් යම් ආකාරයක තොරතුරු සම්පාදනයක් සිදුවේ.
තොරතුරු සම්පාදන කාර්යය ගුණාත්මක බවින් වඩාත් ඉහළ අගයක් ගන්නේ එහි තොරතුරුවල නිරවද්‍යතාව වඩාත් ඉහළ මට්ටමක පැවතීම මත යි.

නිදසුන් -

- ලිපිනයක් ලබා දීම.
- භාණ්ඩයක මිල ගණන් පැවසීම.
- රැකියාවකට ඉල්ලුම් කිරීමේ දී ජීව - දත්ත පත්‍රිකාවක් ලබාදීම.
- මාර්ග ආලෝක සංඥා මගින් නැවතීමට හෝ පිටවීමට දන්වා සිටීම.

ආදී අවස්ථා තොරතුරු සම්පාදන කාර්යය හා සම්බන්ධ අවස්ථා ලෙස සැලකේ.

අනෙක් අතට



- දුරකථන නාමාවලි
- පන්ති නාම ලේඛන
- භූගෝලීය සිතියම්
- කාටූන්

මගින් ද තොරතුරු සම්පාදන කාර්යය ම සිදුවේ.

තොරතුරු සම්පාදනය විවිධ අයුරින් සිදුවිය හැකි අතර වර්තමානය වන විට මෙය වානිජ මුහුණුවරක් ගත් ලාභ උපයන ක්‍රියාවලියක් බවට පත්ව ඇත.

- **උපදෙස් සම්පාදනය/අධ්‍යාපනය**

මෙහි දී ද තොරතුරු සම්පාදනයක් මූලික වශයෙන් සිදුවන නමුත් ඉන් ඔබ්බට ගිය ක්‍රියාකාරී ස්වභාවයක් උසුලන යමක් සිදුවේ.
එහි දී හුදු කරුණු දැක්වීමකට සීමා නොවී කිසියම් සංවිධානාත්මක හෝ අර්ථකථනාත්මක ඉදිරිපත් කිරීමක් සිදුවේ.

පරිගණකයක් භාවිත කර ලිපියක් සකස් කර ගන්නේ කෙසේ දැයි ඔබ තවත් අයකු දැනුවත් කිරීම උපදෙස් සම්පාදනයකි.



එහි දී පරිගණක සම්බන්ධ මූලික තොරතුරු වලට අමතරව එම කාර්යය සිදුකරන අයුරු ඊට සම්බන්ධ විවිධ මෙවලම්වල ක්‍රියාකාරිත්වය ආදිය පැහැදිලි කරමින් සංවිධානාත්මක ඉදිරිපත් කිරීමක් තොරතුරු සම්පාදනයෙන් ඔබ්බට ගිය උපදෙස් සම්පාදනයක් නැතහොත් අධ්‍යාපන කාර්යයක් වන්නේ ය.

නිදසුන් -

**දේශන, වැඩමුළු, සම්මන්ත්‍රණ, පෙළ පොත්, ආදිය මගින් මූලික වශයෙන් සිදු කරනුයේ ද අධ්‍යාපන කාර්යයකි.**

- **පෙළඹවීම**



ඇතැම් සන්දේශ මගින් යමෙකු සිතන පතන ආකාරයේ හෝ කටයුතු කරන ආකාරයේ වෙනසක් සිදුකිරීම අරමුණු කරයි. එනම් ආකල්පමය හෝ චර්යාමය වෙනසක් ඇති කිරීම යි. මෙය පෙළඹවීම යි.

දෛනික කාර්යයන්හි දී තවත් අයකුගේ සහභාගිත්වය අවැසි විටෙක ඒ අය ඒ සඳහා පොළඹවා ගත යුතු ය.
පෙළඹවීමේ අරමුණින් බොහෝ විට සිතාමතා සැලසුම් සහගත ව සන්දේශ සකස් කරනු ලබයි. කථනය, ලේඛනය, රූපමය ඉදිරිපත් කිරීම් ආදී විවිධ වූ උපාය උපක්‍රම මේ සඳහා යොදා ගැනේ.
එමෙන් ම අවශ්‍යතාව, අවස්ථාව, අදාල බව වැනි ආනුෂංගික අනෙකුත් වැදගත් සාධක පිළිබඳව අවධානයන් යොමු කරමින් වඩාත් සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම මත මෙම සන්දේශවල සාර්ථකත්වය රඳා පවතී.

- **විනෝදාස්වාද සම්පාදනය**



සන්නිවේදනය සමඟ විනෝදය එකතු වූ විට එය වඩාත් සිත් ගන්නා සුළු අත්දැකීමක් බවට පත්වේ.

ඉහත ආකාරයේ කවර සන්නිවේදන කාර්යයක් වුව ද ආකර්ෂණීය ලෙස හා ආයාසයකින් තොරව සිදුකිරීමට විනෝදාස්වාදය යොදා ගත හැකි ය.

සන්නිවේදන අවස්ථාවට උචිත ලෙස හාස්‍ය මුසුකර ගැනීමේ අපූරු කුසලතාව හොඳ සන්නිවේදනයකු සතුව නිතැතින් ම පවතී.

- දෙදෙනකු අතර සංවාදයක දී,
- පිරිසක් අමතා කරන දේශනයක දී,
- ලිඛිත සන්නිවේදන අවස්ථාවක දී,

මෙම කුසලතාව අතිශය ප්‍රයෝජනවත් ය.

අතිශය කාර්යය බහුල, ආතතියෙන් පිරි ජීවිතයක් ගත කරන්න වුන්ට මෙය එක්තරා ආකාරයක ඉහිල්වීමක් හා සැහැල්ලුවක් ගෙන දෙන්නකි.

කෙසේ නමුත් සන්නිවේදනයේ දී මෙහි සීමාව පිළිබඳ අවබෝධයෙන් කටයුතු කිරීම වැදගත් වේ.

ඉහත සඳහන් සන්නිවේදනයේ මූලික කාර්යය වලට අමතරව ජන සන්නිවේදනයට ම විශේෂිත වූ කාර්යයන් කිහිපයක් හඳුනා ගත හැකිය. (**සුපරීක්ෂණය, අර්ථකථනය, සහසම්බන්ධය, සමාජානුයෝජනය.**

# 12 ශ්‍රේණිය

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යනය

# පාඩම් අංක - 02

## I පත්‍රය

1. සන්නිවේදනය යන පදයේ පෘථුල අර්ථය වන්නේ,
   - I දැනගත් දේ දැන ගැනීමට සැලැස්වීම යි.
   - II මැනවින් දැනුම්දීම යි.
   - III පොදු බවට පත් කිරීම යි.
   - IV සබඳතා පැවැත්වීමේ ක්‍රියාවලිය යි.
   - V තොරතුරු ගැනීම හා දීම යි.

2. ප්‍රාථමික සමාජයන් හි විසූ ජනයා සිය සරල අවශ්‍යතා සපුරා ගත්තේ,
   - I ප්‍රාථමික භාෂාව මගිනි.
   - II සංඥා, ශබ්ද, සංකේත මගිනි.
   - III අකුරු, දුම්, කොළ අතු මගිනි.
   - IV චිත්‍ර, දුම් හා භාෂාව මගිනි.
   - V චිත්‍ර ,රූප සටහන් හා සංඥා මගිනි.

3. සන්නිවේදනය පිළිබඳ වඩාත් නිවැරදි අදහසක් වනුයේ,
   - I තොරතුරු හුවමාරු ක්‍රියාවලියකි.
   - II මානවයාට පමණක් සුවිශේෂ වූවකි.
   - III කතා කිරීම මගින් සිදුකරනු ලබන්නකි.
   - IV පෙළඹවීමේ අරමුණින් ක්‍රියාත්මක වේ.
   - V සෑම විටම ද්වි පාර්ශවීය ක්‍රියාවලියකි.

4. සන්නිවේදනයේ ආරම්භය පිළිබඳ යාලුවන් තිදෙනකු ප්‍රකාශ කළ අදහස් පහත දැක්වේ.

   සුපුන් - භාෂාව නිපදවා ගැනීමත් සමඟම සන්නිවේදනය ඇරඹුණි.

   නිපුන් - මානව ඉතිහාසය තරම් ම ඈතට දිව යයි.

   කසුන් - උපකරණ භාවිතය හුරු වීමත් සමඟ මානව සන්නිවේදනය බිහිවිය.

   ඉහත ප්‍රකාශ අතරින් වඩාත් නිවැරදි වන්නේ,
   - I නිපුන් පමණි.
   - II සුපුන් පමණි.
   - III කසුන් පමණි.
   - IV නිපුන් සහ කසුන් පමණි.
   - V සුපුන් සහ කසුන් පමණි.

5. සන්නිවේදන ක්‍රියාවලිය සාර්ථකවීමට නම්,

I සන්නිවේදකයාට සන්දේශකරණය පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතුය.

II සන්නිවේදකයා හා ග්‍රාහකයා සම සමාජ ක්‍රමයකට අයත් විය යුතුය.

III සන්නිවේදකයා හා ග්‍රාහකයා දුරස්ථ නොවිය යුතුය.

IV සන්දේශ හුවමාරුව සඳහා තාක්ෂණික මෙවලම් භාවිත විය යුතුය.

V සන්නිවේදක ග්‍රාහක පාර්ශව අතර සමාන ආකාරයේ පූර්ව අත්දැකීම් වැඩි ප්‍රමාණයක් තිබිය යුතුය.

6. සන්නිවේදනය ද්විපාර්ශවික ය. ඊට උදාහරණ අවස්ථාවක් වන්නේ,

I විදුහල්පතිතුමා විසින් සිසු දරුවන්ට අවවාද කිරීම .

II Covid 19 පිළිබඳ රූපවාහිනී මාධ්‍ය තුළින් දෛනික තොරතුරු ඉදිරිපත් කිරීම.

III ධර්ම දේශනාවක් සිදු කිරීම.

IV මාධ්‍යවේදීන් විමසන ප්‍රශ්නවලට මැති ඇමැතිවරුන් පිළිතුරු සැපයීම.

V මහජන රැළියක් ඇමතීම.

7. සන්නිවේදන ක්‍රියාවලියක සන්නිවේදකයා යනු,

I තනි පුද්ගලයෙක් II කණ්ඩායමක්

III සංවිධානයක් IV ආයතනයක්

V ඉහත ඕනෑම අවස්ථාවක් විය හැකිය.

8. විදුහල්පතිවරයා කළ කතාව තේරුම් ගැනීමට ගත් උත්සාහයේ දී සිසු- සිසුවියන් තුළ සිදුවන්නේ,

I ආකේතකරණය II විකේතිකරණය

III ප්‍රතිනිර්මාණය IV සම්ප්‍රේෂණය

V පරිවර්තනය

9. කේත උපයෝගී කරගනිමින් ඒවා සන්දේශ බවට පත්කිරීමේ ක්‍රියාවලිය හඳුන්වන්නේ,

I ප්‍රතිපෝෂණය. II විකේතකරණය.

III ආකේතකරණය. IV අභිසරණය.

V සංකේතකරණය.

10. ගණිත ආචාර්යවරයා කළු ලෑල්ලේ ලියූ අංක කිහිපයක් අපහැදිලි වීම නිසා කමල් සිය පොතෙහි ලියාගත් අංක සාවද්‍ය විය. එබැවින් පිළිතුරු ද අසාර්ථක විය. මෙය සන්නිවේදන විග්‍රහය අනුව,

I ග්‍රාහක දෝෂයකි. II බාධක තත්ත්වයකි.

III සාවද්‍ය චින්තනයකි. IV පරිකල්පන ගැටළුවකි.

V අනවබෝධයකි.

11. නිවාසාන්තර ක්‍රීඩා තරඟයක් අතරතුර දී ක්ලාන්ත වූ ක්‍රීඩකයෙකුට ප්‍රථමාධාර ලබාදුන් නිවාස නායකයෙකු සඳහන් කළේ තමා කියවා තිබූ පොත් පත් හා ප්‍රථමාධාර දෙන ආකාරය නිරීක්ෂණය කර තිබීම ඒ සඳහා උපකාරී වූ බවකි. මෙම කරුණු අයත් වන සන්නිවේදන මූලිකාංගය වන්නේ,

I ආකේතකරණයයි. II විකේතකරණයයි.
III ප්‍රතිපෝෂණයයි. IV අත්දැකීම් පසුතලයයි.
V සන්දේශ ග්‍රහණයයි.

12. සන්නිවේදන ක්‍රියාවලිය තුල එහි ව්‍යුහාත්මක ස්වරූපය හඳුනාගත හැකි මූලිකාංග වන්නේ,

I සන්නිවේදකයා, සංදේශය හා මාධ්‍ය
II තොරතුරු මූලාශ්‍ර, සන්නිවේදකයා හා ග්‍රාහකයා
III සන්නිවේදකයා, මාධ්‍ය හා ප්‍රතිපෝෂණය
IV සන්නිවේදකයා, බාධක හා ග්‍රාහකයා
V සන්නිවේදකයා, සන්දේශය හා ග්‍රාහකයා

13. සන්නිවේදකයාගේ සිතුවිලි, පණිවිඩ බවට පරිවර්ථනය වීමේ ක්‍රියාවලිය හැඳින්වෙන්නේ,

I භාෂණය ලෙසයි II සංජානනය ලෙසයි
II පරිකල්පනය ලෙයසි IV සම්ප්‍රේෂණය ලෙසයි
V ආකේතකරණය ලෙසයි

14. සන්නිවේදන ස්ථානයේ සිට අපේක්ෂිත පාර්ශවය වෙත සන්දේශ ගෙන යාම සඳහා වඩාත් උචිත මාධ්‍ය අතරට අයත් නොවන්නේ,

I ශ්‍රව්‍ය මාධ්‍ය II දෘශ්‍ය මාධ්‍ය
III කාල මාධ්‍ය IV ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය
V ලිඛිත මාධ්‍ය

15. ප්‍රතිපෝෂණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් වඩාත් ගැලපෙන ප්‍රකාශය වන්නේ,

I සන්නිවේදකයා ග්‍රාහකයාට කරනු ලබන බලපෑම යි.
II සන්නිවේදක හා ග්‍රාහක පාර්ශව අතර සිදුවන තොරතුරු හුවමාරුව යි.
III ග්‍රාහකයා විසින් සන්නිවේදකයා වෙත ලබා දෙන හඳුනාගත හැකි ආකාරයේ ප්‍රතිචාරය යි.
IV ප්‍රතිපෝෂණය සැම විටම ධණාත්මක යි.
V සන්නිවේදනයේ ගුණාත්මක බව අඩුවීමට හේතු වෙයි.

16. කොවිඩ් - 19 එන්නත්කරණය පිළිබඳ දැන්වීම් පුවරුවක අලවා තිබූ දැන්වීමක් කියවීමට අපහසු වූයේ වර්ෂාවට හසුවී අකුරු බොඳ වී තිබූ නිසාය. මෙහි ඇති සන්නිවේදන බාධකය වන්නේ,

I ශාරීරික බාධක II මාධ්‍ය බාධක
III අර්ථ බාධක IV දෘශ්‍ය බාධක
V සාක්ෂරතා බාධක

17. සන්නිවේදනයේ ස්වභාවයක් නොවන්නේ,

I මානව සමාජයේ පැවැත්ම බව | II ක්‍රියාපටිපාටියක් බව

III බලය වන බව | IV අරමුණු සහගත බව

V සන්දර්භානුගත බව

18. යම් සන්නිවේදන ක්‍රියාවලියක් සිදු වන්නා වූ වටපිටාව හඳුන්වන්නේ,

I අත්දැකීම් පසුතලය ලෙස ය. | II ප්‍රතිචාරය ලෙෂ ය.

III සන්දර්භය ලෙස ය. | IV ප්‍රතිපෝෂණය ලෙස ය.

V බලපෑම ලෙස ය.

19. සෑම විටම සන්නිවේදනය සිදුවන්නේ,

I ඒක පාර්ශවිකව ය. | II ක්‍රියාවලියක් ලෙසිනි.

III ද්වි මාර්ගිකව ය. | IV ප්‍රතිචාර ප්‍රතිපෝෂණ මත ය.

V භාෂාව මත පදනම් වෙමිනි.

20. තනුලි සිය මිතුරියට දුරකථන ඇමතුමක් ලබා ගනිද් දී ''ඔබ ඇමතූ ග්‍රාහකයා කාර්යය බහුල බැවින් මේ මොහොතේ සම්බන්ධ කළ නොහැක'' යන්න භාෂා ත්‍රිත්වයෙන් ම ප්‍රතිවාදනය විය. මෙහි ග්‍රාහකයා වන්නේ,

I තනුලි කතාකළ දුරකථනය යි . | II තනුලි ගේ මිතුරිය යි.

III දුරකථන සේවා සැපයූ ආයතනය යි. | IV ඇගේ මිතුරියගේ දුරකථනය යි.

V මෙහි ග්‍රාහකයා දැක්විය නොහැක.

21. සන්නිවේදනය සංකේතාත්මක ය යන්නට උදාහරණයක් වන්නේ,

I අතීත මානවයා ගේ ගුහා සිතුවම් ය.

II අතින් ලියන ලද ලියවිල්ලකි.

III නිදහස සැමරීමට ඔසවන ලද ජාතික කොඩිය යි.

IV වමට හැරවිය යුතු බවට වන මාර්ග සංඥාව යි.

V ඉහත සියල්ලම ය.

22. මානව සමාජය තුළ සන්නිවේදනය මගින් ඇති කළ හැකි ප්‍රබල සමාජ මෙහෙවර වන්නේ,

I සමාජ ශික්ෂණය ඇති කිරීම. | II අදහස් පොදු බවට පත් කිරීම.

III අන්තර් පුද්ගල සබඳතා ගොඩ නැංවීම. | IV ග්‍රාහක බලපෑමක් ඇති කිරීම.

V විනෝදාස්වාදය සම්පාදනය කිරීම.

**23.** හිමායා සිය නැගණියට පරිගණකය භාවිත කරමින් ගණිත ගැටලුවක් විසඳන ආකාරය පිළිබඳ උපදෙස් ලබා දී භාවිත කළ යුතු මෙවලම් පිළිබඳව ද පැහැදිලි කළාය. මෙහි දක්නට ලැබෙන සන්නිවේදන කාර්යය වන්නේ,

I ගැටළු විසඳීම යි. II සමාජානුයෝජනය යි.
III තොරතුරු සම්පාදනය යි. IV අධ්‍යාපනය ලබා දීම යි.
V පෙළඹවීම යි.

**24.** ප්‍රමාදි ප්‍රතිපෝෂණයක් දැකිය හැකි මාධ්‍යය වන්නේ,

I ජන මාධ්‍ය II නව මාධ්‍ය
III ජන සන්නිවේදනය IV සමාජ මාධ්‍ය
V සාම්ප්‍රදායික මාධ්‍ය

**25.** සන්නිවේදනය මගින් ඉටු කරනු ලබන මූලික කාර්යයන් හතර අතරට අයත් නොවන්නේ,

I පෙළඹවීම II උපදෙස් සම්පාදනය
III විනෝදාස්වාද සම්පාදනය IV සුපරීක්ෂණය
V තොරතුරු සම්පාදනය

**26.** විශ්‍රාමික විදුහල්පති වරයෙකු වූ සිරිසේන මහතා සිය මිණිබිරිය කැඳවා ඇස් පෙනීම දුර්වල බැවින් බැංකුව මගින් එවන ලද ලිපිය දී එය ශබ්ද නගා කියවන ලෙස පැවසීය. මෙහිදී ඇතිවූ සන්නිවේදන බාධකය වන්නේ,

I මානසික බාධකය යි . II මාධ්‍ය බාධකය යි.
III පාරිසරික බාධකය යි. IV අර්ථ බාධකය යි.
V දෘශ්‍ය බාධකය යි.

**27.** සන්නිවේදකයා විසින් ග්‍රාහකයා වෙත යම් සන්දේශයක් ලබාදුන් පසු ග්‍රාහකයා තුළ ඇතිවන වෙනස,

I බලපෑමයි II ප්‍රතිපෝෂණය
III සමාජානුයෝජනය IV අත්දැකීමයි
V ඉගෙනීමයි

**28.** ''සන්නිවේදනය යනු යම් තැනක දී නිර්මාණය කරගත් හෝ තෝරාගත් පණිවිඩයක් ඒ ආකාරයෙන්ම හෝ ඊට සමාන ලෙස වෙනත් තැනකදී ප්‍රතිනිර්මාණය කිරීමයි''
මෙම නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ,

I හැරල් ඩී ලැස්වෙල් II විල්බර් ශ්‍රාම්
III ශැනන් සහ වීවර් IV චාල්ස් එච් කූලි
V ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂය

29. කවර සන්නිවේදන කාර්යයක් වුවද ආකර්ෂණීය ලෙස හා ආයාසයකින් තොරව සිදු කිරීම සඳහා වඩාත් උචිත වන්නේ,

I පෙළඹවීම් යොදාගැනීම යි.
II විනෝදාස්වාදය යොදා ගැනීම යි.
III උපදේශනය යොදා ගැනීම යි.
IV අධ්‍යාපනය යොදාගැනීම යි.
V සමාජානුයෝජනය යොදා ගැනීම යි.

30. ජන සන්නිවේදනයට අයත් වූ විශේෂිත කාර්යයන් අතරට අයත් නොවන්නේ,

I සමාජානුයෝජනය
II සහසම්බන්ධය
III සුපරීක්ෂණය
IV අර්ථකථනය
V නිරීක්ෂණය

# 12 ශ්‍රේණිය

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යනය

# පාඩම් අංක - 02

## II පත්‍රය

01 I සන්නිවේදනය යන්න කෙටියෙන් හඳුන්වන්න. (ල. 04)

II සන්නිවේදනයේ ස්වභාවය කරුණු තුනක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ල. 08)

III සන්නිවේදනය ''සන්දර්භානුගත ය'' යන කියමන නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ල. 12)

IV තොරතුරු සම්පාදනය හා අධ්‍යාපන කාර්යය සන්නිවේදනයේ ප්‍රධාන කාර්යයන් දෙකකි. සුදුසු උදාහරණ සපයමින් පැහැදිලි කරන්න. (ල. 16)

02 I සන්නිවේදන අරමුණු හතරක් සඳහන් කරන්න. (ල. 04)

II අර්ථ බාධක හා මාධ්‍ය බාධක යන්න හඳුන්වන්න. (ල. 08)

III මාර්ග ආලෝක සංඥා පුවරුවක කොළ පාට බල්බය දැල්වී තිබිය දී සුනිල් සිය මෝටර් රථය නොනවත්වා ඉදිරියට ධාවනය කරන ලදී. එහි දී ඔහුට උපකාරී වූ සන්නිවේදන මූලිකාංග විස්තර කරන්න. (ල. 12)

IV විනෝදාස්වාද සම්පාදනය සඳහා වර්තමාන මාධ්‍ය තුළ දැකිය හැකි වැඩසටහන් නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 16)

03 I සන්නිවේදනය සංකේතාත්මක ය යන්න කෙටියෙන් හඳුන්වන්න. (ල. 04)

II සන්නිවේදන ක්‍රියාවලියක දී ග්‍රාහක ස්වභාවය කෙබඳු වේ ද? යන්න පැහැදිලි කරන්න. (ල. 08)

III ඔබ කැමති මාධ්‍ය සන්දේශයක් තෝරාගෙන සන්නිවේදනය ස්වභාවය හා බැඳුණු ලක්ෂණ පැහැදිලි කරන්න. (ල. 12)

IV සන්නිවේදන ක්‍රියාවලියක දී ඇතිවිය හැකි ප්‍රධාන බාධක වර්ග දෙක සඳහා නිදසුන් සපයන්න. (ල. 16)

04 I සන්නිවේදනය පිළිබඳ චාල්ස් එච් කූලි ගේ නිර්වචනය ලියා දක්වන්න. (ල. 04)

II සන්නිවේදනය ද්වි - මාර්ගික ය. ඊට උදාහරණයක් සපයන්න. (ල. 08)

III දෙවන ශ්‍රේණියේ ගුරුතුමිය ක්‍රීඩාවක් යොදා ගනිමින් ගණිත සංකල්පයක් ඉගැන්වූවාය. මෙහිදී ඉටු වන ප්‍රධාන සන්නිවේදන අරමුණු දෙක විස්තර කරන්න. (ල. 12)

IV සන්නිවේදන ක්‍රියාවලියක සාර්ථකත්වය සම්බන්ධයෙන් වැදගත් වන අංගයක් ලෙස ප්‍රතිපෝෂණය යන්න නිදසුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 16)

## 12 ශ්‍රේණිය
## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යනය
## පාඩම් අංක - 02
### පිළිතුරු පත්‍රය I

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | - | I | 11 | - | IV | 21 | - | V |
| 2 | - | II | 12 | - | V | 22 | - | III |
| 3 | - | I | 13 | - | V | 23 | - | IV |
| 4 | - | I | 14 | - | III | 24 | - | I |
| 5 | - | V | 15 | - | III | 25 | - | IV |
| 6 | - | IV | 16 | - | II | 26 | - | II |
| 7 | - | V | 17 | - | I | 27 | - | I |
| 8 | - | II | 18 | - | III | 28 | - | III |
| 9 | - | III | 19 | - | II | 29 | - | II |
| 10 | - | II | 20 | - | III | 30 | - | V |

### පිළිතුරු පත්‍රය II

**(01)**

**(I)** අදහස් හා තොරතුරු හුවමාරු කර ගැනීම, සම්බන්ධතාව, අවබෝධය, සාකච්ඡාව, ග්‍රහණය කරගැනීම, සංස්කෘතික සම්ප්‍රේෂණය, සිනහව, අභිනය යනාදී වූ සාපේක්ෂ වූ පොදු අදහස සන්නිවේදනයයි. සන්නිවේදනය දෛනික ජීවිත කාර්යයන් හා සම්බන්ධ වූවක් බැවින් මානවයෙකු වශයෙන් අප සිදුකරන සිතීම, ස්පර්ශය, ආඝ්‍රාණය, දැකීම, කතා කිරීම, විඳීම, කියවීම, ලිවීම, විනෝද වීම යන සෑම කාර්යයක් සඳහා ම සන්නිවේදනය බලපායි. පුද්ගල හා සමාජ සම්බන්ධතාවයන්ගේ පදනම සන්නිවේදනය යි.

**(II)** සන්නිවේදනය අරමුණු සහගත ය.
සන්නිවේදනය සංකේතාත්මක ය.
සන්නිවේදනය සන්දර්භානුගත ය.
සන්නිවේදනය ක්‍රියා පටිපාටිය කි.

(III) සන්නිවේදනය සන්දර්භානුගත ය.

කවර හෝ සන්නිවේදනයක් සිදුවන්නේ කිසියම් සන්දර්භයක් තුළයි. මෙම ගින් අදහස් කරන්නේ අදාළ සන්නිවේදනය සිදුවන වටපිටාව නැතහොත් පරිසරයයි.

සන්නිවේදන කාර්යය හා සන්දර්භය අතර සෘජු සම්බන්ධයක් පවතී. සන්දර්භයට ගැලපෙන ලෙස සන්නිවේදන කාර්යය සකස් විය යුතු ය.

නිදසුනක් ලෙස :- අවමංගල උත්සවයක ට අදාල සන්දර්භය ලෙස සැලකුවහොත් ඊට අනුරූපව භෞතික වටපිටාව, පුද්ගලයන්, සංස්කෘතික අංග යනාදී සියල්ල සන්දර්භ ලෙස ගත හැකි ය.

(IV) <u>තොරතුරු සම්පාදනය</u>

ඕනෑම සංදේශයක් තොරතුරක් ලෙස සැලකිය හැකි අතර සෑම සන්නිවේදන අවස්ථාවකදීම අඩු වැඩි වශයෙන් තොරතුරු සම්පාදනය සිදු වේ.

තොරතුරු සම්පාදනය තුළින්,

- විවිධ වැදගත් දේ පිළිබඳ දැනුම අවබෝධය ලබා දීම.
- නිරන්තරයෙන් පරිසරය පිළිබඳ අවදියෙන් සිටීමට හැකි වීම.
- විවිධ මතවාද ගොඩ නැගීම.
- සංස්කෘතිය අඛණ්ඩව රැක ගැනීමට හැකි වීම.
- විවිධ ආපදා ව්‍යසනයන් පිළිබඳව පූර්ව දැනුම් දීම.
- තොරතුරු අලෙවි කළ හැකි දෙයක් වීම.
- ජන විඥානය පුළුල් කිරීම.

තොරතුරුවල නිරවද්‍යතාවය මත තොරතුරු සම්පාදන කාර්යය ගුණාත්මක බවින් වඩාත් ඉහළ අගයක් ගනී.

නිදසුනක් ලෙස :- ලිපිනයක් ලබා දීම, භාණ්ඩයක මිල ගණන් පැවසීම.

<u>අධ්‍යාපන කාර්යය</u>

මෙහිදී තොරතුරු සම්පාදනයක් මූලික වශයෙන් සිදුවන නමුත් ඉන් ඔබ්බට ගිය ක්‍රියාකාරී ස්වභාවයක් උසුලන්නා වූ යමක් සිදු වේ.

එය හුදු කරුණු දැක්වීමකට පමණක් සීමා නොවී එහි කිසියම් සංවිධානාත්මක හෝ අර්ථකනාත්මක ඉදිරිපත් කිරීමක් දැකිය හැකිය. තොරතුරු සම්පාදනයෙන් ඔබ්බට ගිය සංවිධානාත්මක ඉදිරිපත් කිරීමකි.

නිදසුන් ලෙස :- දේශන, සම්මන්ත්‍රණ, වැඩමුළු

(02)

(I) තොරතුරු සම්පාදනය

උපදෙස් සම්පාදනය/ අධ්‍යාපනය

පෙළඹවීම

විනෝදාස්වාද සම්පාදනය

**(II) අර්ථ බාධක**

**සන්දේශය අර්ථය හරිහැටි ග්‍රහණය කර ගැනීමට නොහැකි වන විට අර්ථ බාධක උද්ගත වේ.**

**නිදසුන් :-**

**උප භාෂා භාවිතය නිසා**

**සාවද්‍ය උච්චාරණයන් නිසා**

**මාධ්‍ය බාධක**

**නාලිකාව හා සම්බන්ධ නාලිකාවේ හෙවත් මාධ්‍යයේ ඇතිවන දෝෂ සහගත තත්ත්වයන් නිසා ඇති වේ.**

**නිදසුන් :-**

**උපකරණ සුසර නොවීම නිසා**

**කණ්ඩායමක ඝෝෂාකාරිත්වය නිසා**

**(III) විකේතකරණය**

**සන්දේශයන්හි අන්තර්ගතය අර්ථකථනය කර අවබෝධ කර ගැනීමේ ක්‍රියාවලිය විකේතකරණය ලෙස හැඳින්වේ.**

**(සංකේත වලින් කියවෙන දේ අවබෝධ කර ගැනීම සඳහා සංකේත අර්ථකථනය කරගත යුතුය.)**

**(IV) සන්නිවේදන අවස්ථාවට උචිත ලෙස හාස්‍ය මුසු කරමින් විනෝදාස්වාද සම්පාදනය වෙනුවෙන් වර්තමාන මාධ්‍ය තුළ විවිධ වැඩසටහන් දැකිය හැකි ය.**

**ගුවන් විදුලි මාධ්‍ය - කණාමැදිරි රාත්‍රිය / ඩී.ජේ. අරා ඇන්ඩ් පැස්බරා**

**රූපවාහිනී මාධ්‍ය - මෙගා ටෙලි නාට්‍ය / හිරු ස්ටාර්**

**(03)**

**(I) සන්නිවේදනය සංකේතාත්මක ය.**

**සන්නිවේදනය යනු සංකේතමය ක්‍රියාකාරිත්වය කි. තොරතුරක් නැතහොත් සංදේශයක් හැමවිට ම සංකේත වලින් සමන්විත වේ. එනම් වචන, සංඥා, ලකුණු, මුද්‍රා, ඉඟි, සිතුවම්, අකුරු පමණක් නොව ශබ්ද රටාව ද සැලකෙන්නේ සංකේත ලෙසිනි.**

**විවිධ වස්තු, පුද්ගලයන්, ස්ථාන මෙන්ම අතිශය සංකීර්ණ හැඟීම්, අදහස්, සංකල්ප ආදිය පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීමට හැකි වී ඇත්තේ සංකේත පදනම් කර ගෙන සිදුකරන සන්නිවේදන ගනුදෙනුව තුළිනි.**

**(II) ග්‍රාහකයා**

**සන්නිවේදන ක්‍රියාවලියක දී තවත් පාර්ශවයක් සමග තොරතුරු, අදහස්, මත, ආකල්ප ආදිය හුවමාරු කරගන්නා තැනැත්තා සන්නිවේදකයා වන අතර පුද්ගලයකු පමණක් නොව අවස්ථානුකූලව, කණ්ඩායමක්, සංවිධානයක්, ආයතනයක් වුව ද සන්නිවේදන ස්ථානය නියෝජනය කරයි .**

(III) සන්නිවේදනයේ ස්වභාවය

- අරමුණු සහගත බව
- සංකේතාත්මක බව
- සන්දර්භානුගත බව
- ක්‍රියාපටිපාටිය බව
- විවිධාකාර බව
- ඒක මාර්ගික - ද්වි වාර්ගික මාර්ගික බව
- බලයක් බව යන ස්වභාවයන් පැහැදිලි කළ යුතු ය.

අර්ථ බාධක- සංදේශයක අර්ථය හරිහැටි ග්‍රහණය කර ගැනීමට නොහැකි වන විට උද්ගත වන බාධක

- විදග්ධ භාෂාවක් යොදා ගැනීම නිසා සිදුවන බාධක
- වැරදි උච්චාරණය හේතුවෙන් සිදුවන බාධක

මාධ්‍ය බාධක- නාලිකාව හෙවත් මධ්‍යයේ ඇති වන දෝෂ සහගත තත්ත්වයන් නිසාවෙන් ඇතිවන බාධක

- උපකරණ සුසර නොවීම
- හදිසි විදුලිය විසන්ධි වීම

(04)

(I) මානව සම්බන්ධතා රඳවා සිටින්නාවූත් වර්ධනය කරන්නා වූත් සියලු සංකේත මෙන්ම ඒවා දේශයෙන් දේශයට , ප්‍රවාහනය කිරිමටත් කාලයේ බැඳුම් වලින් ඔබ්බට ගොස් සුරක්ෂිත කිරීමටත් උපකාරී වන උපක්‍රම සන්නිවේදනයයි.

(II) සන්නිවේදනය ගනුදෙනුවකි. එනම් තොරතුරු ලබා ගැනීම හා ලබා දීම යන කාර්යය දෙකම සිදු වේ. මෙම ගනුදෙනුවට සම්බන්ධ වන පාර්ශව දෙකම ඊට සක්‍රියව දායක වීමටත් ඉහළ ප්‍රතිඵල ලැබිය හැක. උදාහරණ :- ප්‍රශ්න විචාරාත්මක තරඟයකට සහභාගී වන සිසුන් පිරිසක්

(III) විනෝදාස්වාද සම්පාදනය
අධ්‍යාපන කාර්යය

(IV) ප්‍රතිපෝෂණය
සන්දේශයක් ලබා දුන් පසු ග්‍රාහකයා ඒ සම්බන්ධයෙන් සන්නිවේදකයාට ලබාදෙන නිරීක්ෂණය කළ හැකි ආකාරයේ ප්‍රතිචාරය ප්‍රතිපෝෂණය යි.